බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
සංස්කෘතික අංශය கலாசார பிரிவு Cultural Division

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව 8 ஆம் மாடி, செத்சிறிபாய பத்தரமுல்லை, ஸ்ரீ லங்கா
8th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka


158

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. CA/6/02/11/සමරු තිළිණ | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date. 2022.01. 24 |

අග්‍රාමාත්‍ය ලේකම්තුමා
අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය

## අස්පර්ශනීය උරුමයන් සංරක්ෂණය සඳහා ජාතික කමිටුවක් පිහිටුවීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අධ්‍යාපන විද්‍යාත්මක සහ සංස්කෘතික ආයතනය (UNESCO) මගින් 2003 වසරේ දී අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය පිළිබඳ අන්තර්ජාතිකව සම්මුතිය ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකාව ද 2008 වසරේ දී මෙම සම්මුතිය සඳහා එකඟතාවයට පත්ව ඇති අතර, ඒ අනුව බටහිරකරණය, ගෝලීයකරණය සහ වාණිජකරණය සහ වෙනස්කම් නිසා ඇති වන අභියෝග හමු වේ මෙම අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමත් ඒවා ප්‍රවර්ධනය කිරිමටත් ඒ සඳහා යෝග්‍ය ප්‍රවේශයක් සකස් කිරිමටත් ශ්‍රී ලංකා රජය බැඳී සිටී.

ඒ අනුව, අස්පර්ශනීය උරුමයන් සුරැකීම සඳහා ස්ථිර ආයතනමය රාමුවක් ගොඩනැගීමට ගරු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ අංක MBCRA/CA/CP/2020-09-27, 2020.02.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020 මාර්තු මස 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය හිමිවිය. (ඇමුණුම 01) උක්ත අනුමැතිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය තුළ, අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සුරැකීම සඳහා ස්ථිර ආයතනමය රාමුවක් අධ්‍යක්ෂවරයෙකු යටතේ පිහිටුවීමට කටයුතු සංවිධානය කර තිබේ. ඒ යටතේ දැනටමත් ශ්‍රී ලංකවේ පහත දැක්වෙන අස්පර්ශනීය උරුමයන් යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුමයක් බවට ප්‍රකාශයට පත් කර තිබේ.

1. පාරම්පරික නූල් රූකඩ කළාව
2. සාම්ප්‍රදායික දුම්බර රටා කළාව

මෙහිදී උක්ත ආයතනවල කාර්යයන් සඳහා අවශ්‍ය අවස්ථානවන්හිදී උපදෙස් ලබා දීමට අස්පර්ශනීය උරුමයන් පිළිබඳ ජාතික කමිටුවක් ස්ථාපිත කළ යුතුව තිබේ.ඒ බව ප්‍රංශයේ ශ්‍රී ලංකා තනාපතිනියගේ 2022.01.11 දිනැති ලිපිය මගින් ද විමසා තිබේ.( ඇමුණුම 02) මෙම කමිටුව අස්පර්ශනීය උරුමයන් නියෝජනය වන රාජ්‍ය නිලධාරීන්ගෙන් සහ ඒ පිළිබඳ බාහිර විශේෂඥයින්ගෙන් සමන්විත විය යුතු අතර ඒ සඳහා පහත පුද්ගලයන් යෝග්‍ය වන බව කාරුණිකව යෝජනා කරමි.

<u>රාජ්‍ය නිලධාරීන්</u>

01. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයන්
02. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
03. ලේකම් ජනරාල් , ශ්‍රී ලංකා යුනෙස්කෝ
04. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හෝ ඔහුගේ නියෝජිතයන්
05. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
06. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
07. ජාතික ශිල්ප සභාවේ සභාපති හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
08. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
09. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති හෝ හෝ ඔහුගේ නියෝජිතයන්
10. අධ්‍යක්ෂ, සංස්කෘතික ප්‍රවර්ධන , බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
11. සහකාර අධ්‍යක්ෂ, (සංරක්ෂණ), ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

<u>බාහිර විශේෂඥයින්</u>

01. ආචාර්ය බී.ඩී.නන්දදේව මහතා
02. මහාචාර්ය එච්.ඩී.යසාංජලී දේවිකා ජයතිලක මිය - ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
03. මහාචාර්ය ඩබ්.ඒ. වීරසූරිය මහතා - කැළණිය විශ්වවිද්‍යාලය
04. ආචාර්ය ඒ.ඒ.ජයන්ත ජයසිරි මහතා - ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
05. ආචාර්ය අනූෂා එදිරිසිංහ මිය - කැළණිය විශ්වවිද්‍යාලය
06. ආචාර්ය ශිවඥානම් ජයසංකර් මහතා - නැගෙනහිර විශ්වවිද්‍යාලය
07. වෛද්‍ය ඩැනිස්ටර් එල්.පෙරේරා මහතා
08. ආචාර්ය සරෝජා වෙත්තසිංහ මහතා -විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල් -ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
09. මතුගම සෙනෙවිරුවන් මහතා

උක්ත කමිටුව සංශෝධනයන්ට යටත්ව ගරු.අග්‍රාමාත්‍යතුමාගේ කාරුණික අනුමැතියට ඉදිරිපත් කරමි.

දේශබන්දු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.